133

# සිංහල වර්ණ මාලාවේ විකාශනය

ජයසිරි ලංකාගේ විසිනි.

කැලණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධි පරීක්ෂණය
සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධය

133

කැලණිය විශ්ව විද්‍යාලය

1988

දුර්ලභ

## සාර සංග්‍රහය

බ්‍රාහ්මී යුගයේ සිට වර්තමාන ස්වරූපය තෙක් සිංහල අක්ෂර විකාශනය පිළිබඳ අධ්‍යයනයක යෙදී ම මෙහි පරමාර්ථය යි. ඒ සඳහා ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 10 වන සියවස දක්වා කාල පරිච්ඡේදය තෝරා ගැනිණි. ශ්‍රී ලංකාවේ බ්‍රාහ්මී අක්ෂරයන්ගේ සම්භවය ක්‍රි.පූ. 3 වන සියවසේ දක්නට ලැබෙන අතර 10 වන සියවස වන විට එම අක්ෂර වර්තමාන හැඩය ගෙන ඇති ආකාරය දැකිය හැකි ය. සමකාලීන ඉන්දීය අක්ෂර මාලාවන්ගේ ප්‍රභාවය සිංහල අක්ෂර පරිණාමය සඳහා කොතෙක් බල පා ඇත් ද යන්න මෙම අධ්‍යයනයේ දී විමංසනයට භාජනය කෙරේ.

පළමුවන පරිච්ඡේදයෙහි ලංකාවට බ්‍රාහ්මී අක්ෂර සංක්‍රමණය වීමත් එහි වර්ධනයත් ගැන ලියැවුණු පොතපත පිළිබඳ සාහිත්‍ය ගවේෂණයකින් අනතුරුව බ්‍රාහ්මී අක්ෂර මාලාවේ සම්භවය පිළිබඳ ව ඉදිරිපත් වී ඇති විවිධ මත සැකෙවින් දක්වා ඇත.

අශෝක අක්ෂර මාලාව හා මූල සිංහල අක්ෂර අතර ඇති සමාන ලක්ෂණත්, ලංකාවේ අක්ෂර වර්ධනයේ දී දකුණු ඉන්දියාවේ අක්ෂරමාලා හා සමාන වේගයකින් වර්ධනය වී ඇති බවත්, දෙවන පරිච්ඡේදයේ දැක් වේ. ලෙන් ලිපිවල දක්නට ලැබෙන ඇතැම් සංකේත රාජ්‍ය ලාංඡන විය හැකි ය. ඒවා බ්‍රාහ්මී අක්ෂර ඇසුරින් සකසා ගත් බව පෙන්වා දීමට සෙල්ලිපි තුළින් ම කරුණු දක්වා ඇත.

තෙවන පරිච්ඡේදයේ ක්‍රි.ව. 1 සිට ක්‍රි.ව. 3 සියවස් කාලය තුළ වර්ධනය වී ඇති අයුරු විග්‍රහ කොට එම වර්ධනයේ දී සමකාලීන දකුණු ඉන්දියානු ශෛලීන් බලපා ඇත්දැයි - විමසීමක් කර ඇත. ලංකාවේ බෞද්ධයින් ඉන්දියාවේ සම සාමයිකයින් අතර පැවති සබඳතා අක්ෂරවල සමානතාවයට හේතු වන්නට ඇතැයි අනුමාන කර තිබේ.

බ්‍රාහ්මී අක්ෂර සිංහල අක්ෂර බවට වර්ධනය වීමේ දී සංක්‍රමණ අවස්ථාවක ලක්ෂණ පෙන්නුම් කරන ක්‍රි.ව. 4 - 5 සියවස්වල අක්ෂර ලතාකාර බවට පත්වීමට ලේඛන ද්‍රව්‍ය වෙනස් වීම මෙන් ම අක්ෂර ශිල්පීන්ගේ සංඛ්‍යාව අධික වීම ද බලපෑවේ ය.

ඉන්දියාව හා සමඟ පැවති ආගමික සබඳතා නිසා මෙකල ලංකාවේ අක්ෂර කෙරෙහි ඉන්දිය ශෛලීන්ගේ ඇතැම් ලක්ෂණ මුසු වී ඇත.

ක්‍රි.ව. 6 - 7 සියවස්වල අක්ෂර කලාවේ පෙරළියක් ඇති වූයේ පුස්කොළ වල ලිවීම හා සමඟ ය. ඇතැම් අක්ෂර ශිල්පීහු කලාත්මකව ලිවීමට උත්සාහ කළහ. තවත් සමහරු පැරණි ක්‍රමය ගරු කළහ. මහායාන ආගමික බලපෑම නිසා සංස්කෘත භාෂාව ලිවීමට අවශ්‍ය වූ අක්ෂර එම ආගමික ග්‍රන්ථවලින් ලබා ගත්හ. මේ නිසා 8 , 9 , 10 සියවස්වල සිංහල අක්ෂර මාලාවට අලුත් අක්ෂර සංඛ්‍යාවක් එක් විය. එහෙත් අක්ෂර මාලාව මෙරටට ආවේණික ශෛලියකින් හා අනන්‍යතාවයක් රැක ගනිමින් වර්ධනය විය. මෙම වර්ධනයේ දී ඇතැම් පුරාක්ෂර විද්‍යාඥයින් දක්වන අන්දමට විදේශීය බලපෑමට නතු නො වී වැඩුණු බව මෙම විග්‍රහයෙන් පැහැදිලි වේ.